සියලු ම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Department of Education, Southern Province

# පළමු වාර පරීක්ෂණය 2019 මාර්තු
# First Term Test, March 2019

10 ශ්‍රේණිය
Grade 10

## චිත්‍ර කලාව - I

පැය එකයි
One hour

- **සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**
- **පහත සඳහන් ඡායාරූපය ඇසුරුකරගෙන අංක 01 - 05 තෙක් ප්‍රශ්නවල හිස්තැන් පුරවන්න.**



01 මෙම වාස්තු විද්‍යා නිර්මාණය ........................................ විහාරයේ පිහිටා ඇත.

02 මෙය ........................................ යුගයේ IV බුවනෙකබාහු රජු සමයේ ඉදිකරන ලදී.

03 මෙම අපූර්ව නිර්මාණය ........................................ කුළුණු ලෙස හැඳින්වේ.

04 මෙය දකුණු ඉන්දීය ශිල්පියකු වන ........................................ විසින් නිර්මාණය කරන ලද්දකි.

05 මෙම කුළුණු ........................................ නම් කොටසේ නිර්මාණය කර ඇත.

- **අංක 06 සිට 10 තෙක් දී ඇති ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.**

06 ගම්පල යුගයට අයත් IV වන බුවනෙකබාහු රජු විසින් කරවන ලද ලංකාතිලක විහාරයේ නිර්මාණ ශිල්පියා කවුද? ........................................

07 ඊතල පහර කා ඉදිරියට පනිමින් සිටින බයිසන් ගව රුව සහ බිම වැතිර සිටින මිනිසකුගේ රුව සහිත චිත්‍ර හමුවන ගුහාව කුමන නමකින් හැඳින්වේ ද? ........................................

08 පිත්තල භාණ්ඩ නිර්මාණයේ දී තහඩු වැඩ එක් ශිල්ප ක්‍රමයක් වන අතර අනෙක් ශිල්ප ක්‍රමය කුමක් ද?

.................................................................................................................................

09 පොළොන්නරුව ගල් විහාරයේ හිටි බුද්ධ ප්‍රතිමාවේ දෙඅත් පපුව මත තබා සිටින ආකාරයෙන් නිරූපිත මුද්‍රාව හැඳින්වෙන නම කුමක්ද? ..........................................................................

10 අනුරාධපුර යුගයේ හමුවන ථූපාරාම ස්තූපයට අලංකාරයක් සේම ආරක්ෂාව සඳහා වටදාගෙයක් එක්කළ රජතුමා කවුද? ..........................................................................

- **අංක 11 - 15 තෙක් දී ඇති එක් එක් ප්‍රශ්නයට වඩාත් නිවැරදි පිළිතුර තෝරා ඊට යටින් ඉරක් අඳින්න.**

11 පර්යාලෝකන සිද්ධාන්තය යනු

(1) වස්තුවක එළිය අඳුර වැටීමයි. (2) ආවරණ වූ හැඩතල දැක්වීමයි.

(3) ඈතට දිස්වන විට කුඩාවී පෙනීමයි. (4) චිත්‍රයක ගැඹුර දැක්වීමයි.

12 එම්. සාර්ලිස් ශිල්පියා විසින් සිතුවම් අඳින ලද විහාරස්ථානයක් නොවන්නේ,

(1) මාළිගාකන්ද විහාරය (2) ඉඳුරුව යාලේගම විහාරය

(3) පොතුපිටියේ පූජාරාමය (4) රණස්ගල්ල විහාරය

13 පෝස්ටර් චිත්‍රයක තිබිය යුතු වඩාත්ම වැදගත් ලක්ෂණය වන්නේ,

(1) පණිවිඩයේ වේගවත් බව (2) වචන ප්‍රමාණය විස්තරව ඇතුළත් කිරීම

(3) අකුරුවලට ප්‍රධාන තැනක් දැක්වීම (4) විස්තරාත්මකව අදහස් දැක්වීම

14 සෙංකෝලයේ ඉහළ ඇති රිදියෙන් කළ ගෝලයේ මතුපිට අල්ප උන්නතව දක්වා ඇති රූපය වන්නේ,

(1) පුන්කලස (2) ධම්මචක්‍රය (3) සිංහ රූපය (4) ඉර හඳ

15 ලංකාතිලක විහාරයේ හිඳි බුදු පිළිමයේ චීවරයේ රැළි දක්වා ඇත්තේ,

(1) සමාන්තර රේඛා මෙන් (2) ද්විත්ව රේඛා මෙන්

(3) රැළි රහිත ආකාරයෙන් (4) දියරැළි ආකාරයෙන්

- **16 සිට 20 තෙක් දී ඇති වචනවල අර්ථය පැහැදිලිවනසේ සම්පූර්ණ වාක්‍ය බැගින් ලියන්න.**

16 කිහිඹි මුහුණ - ..........................................................................

..........................................................................

17 නියපොතු වැඩ - ..........................................................................

..........................................................................

18 මර වාහනම් - ..........................................................................

..........................................................................

19 ලකුණු කැපීම - ..........................................................................

..........................................................................

20 සන්නිදර්ශන චිත්‍ර - ..........................................................................

..........................................................................

● ප්‍රශ්න අංක 21 සිට 25 තෙක් දී ඇති රූප සටහන්වලට කිසියම් සබඳතාවක් දක්වන රූප සටහන ඉදිරියෙන් ඇති **A, B, C, D, E** යන රූප අතුරෙන් තෝරා, එහි අක්ෂරය තිත් ඉර මත ලියන්න.

21.  ....................................  A

22.  ....................................  B

23.  ....................................  C

24.  ....................................  D

25.  ....................................  E

- ප්‍රශ්න අංක 26 සිට 30 තෙක් දී ඇති එක් එක් වාක්‍යයෙහි හිස්තැනට සුදුසු වචන/වචනය යොදා වාක්‍ය සම්පූර්ණ කරන්න.

26 යාලි රුව යෙදීම මගින් හින්දු භක්තිකයන්ගේ ........................................ සංකේතවන බවට විශ්වාසයක් පවතියි.

27 සිංහල සැරසිලි කලාවේ දක්වෙන මුහුණට මුහුණලා සිටි ඇතකුගේ හා ගවයකුගේ හිස් එකට සම්පිණ්ඩනය වන සේ ............................................ නිර්මාණය කර ඇත.

28 කිරියාය වටදාගෙය ............................................................ යුගයට අයත් උසස් කලාත්මක නිර්මාණයකි.

29 සිළුමිණ පත්‍රයේ පළවූ 'ඉන්දු' නම් චිත්‍ර කථාව නිසා ........................................ ශිල්පියා ජනප්‍රියත්වයට පත්වූහ.

30 දම් වර්ණයට විසංගතවූ වර්ණය ........................................................ පැහැයයි.

- අංක 31 - 35 තෙක් දී ඇති ප්‍රශ්නවලට **F, G, H, I, J** යන රූප සටහන් ඇසුරෙන් පිළිතුරු සපයන්න.



F G H I J

31 F අක්ෂරයෙන් දක්වෙන සැරසිලි ඒකකය ............................................................ ගණයට අයත්වේ.

32 G අක්ෂරයෙන් දක්වෙන සඳකඩ පහණ ............................................................ යුගයට අයත් බව කිව හැකිය.

33 H අක්ෂරයෙන් දක්වෙන්නේ ............................................................ විහාරයේ ඇඳ ඇති සිතුවමකි.

34 I නිර්මාණයට ප්‍රසිද්ධ ප්‍රදේශයක් ලෙස ............................................................ නගරය හැඳින්විය හැකිය.

35 J සිතුවම ............................................................ ශිල්පියාගේ විහාර සිතුවමකි.

- මෙහි දක්වෙන වර්ණ චිත්‍රය හඳුනාගෙන එහි කලාත්මක අගය විග්‍රහ කෙරෙන පරිදි අංක 36 - 40 තෙක් දී ඇති උප මාතෘකාවලට අදාළ අර්ථවත් වාක්‍ය පහක් ලියන්න.



36 තේමාව ........................................................

........................................................

37 ශිල්පියා ........................................................

........................................................

38 සම්පිණ්ඩනය ........................................................

........................................................

39 ආභාසය ........................................................

........................................................

40 භාව ප්‍රකාශනය ........................................................

........................................................

සියලු ම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Department of Education, Southern Province

පළමු වාර පරීක්ෂණය 2019 මාර්තු
First Term Test, March 2019

10 ශ්‍රේණිය
Grade 10

# චිත්‍ර කලාව - II

පැය දෙකයි
Two hours

## නිදහස් රේඛාමය ඇඳීම හා වර්ණ චිත්‍ර සම්පිණ්ඩනය

★ ඔබ ඉදිරියේ තබා ඇති ද්‍රව්‍ය සමූහය හොඳින් නිරීක්ෂණය කර

1. රේඛා මගින් පූර්ව අවධ්‍යයනයක යෙදෙන්න.
2. ද්‍රව්‍ය සමූහය ඔබට පෙනෙන අයුරින් ඇඳ, වර්ණ කරන්න.

- රේඛා අධ්‍යයනය

1. රේඛා අධ්‍යයනය හා වර්ණ චිත්‍රය යන දෙකම එකට අමුණා භාර දෙන්න.
2. ද්‍රව්‍ය සමූහය තලය මත කලාත්මකව සම්පිණ්ඩනය කරන්න.
3. පරිමාණ, පර්යාලෝක රීති හා ත්‍රිමාණ ලක්ෂණ පිළිබඳ අවබෝධය
4. ද්‍රව්‍ය සමූහයේ මතුපිට ස්වභාවය හා ගතිලක්ෂණ දැක්වීම.
5. වර්ණ හැසිරවීමේ ශිල්පීය කුසලතා
6. උචිත පසුබිමක් හා සමස්ත නිමාව

සැ.යු.:

ද්‍රව්‍ය සමූහය තබා ඇති ලෑල්ල විශාලව ඇඳීම අවශ්‍ය නොවේ. ලෑල්ලේ පරිමාණය ද්‍රව්‍ය සමූහයට ගැලපෙන අයුරින් වෙනස්කර ඇඳීමට ඔබට අවසර ඇත.

සියලු ම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Department of Education, Southern Province

පළමු වාර පරීක්ෂණය 2019 මාර්තු
First Term Test, March 2019

10 ශ්‍රේණිය
Grade 10

# චිත්‍ර කලාව - III

පැය දෙකයි
Two hours

සැලකිය යුතුයි

- දිය සායම්, පෝස්ටර් සායම්, පැස්ටල් ඇතුළු අතේ නොගෑවෙන ඕනෑම වර්ණ මාධ්‍යයක් වර්ණ කිරීමට භාවිත කළ හැකිය. (ෆේල්ට් පෑන් භාවිතය සුදුසු නැත.)
- පහත දී ඇති 'අ', 'ආ', 'ඉ' කොටස්වලින් එක් මාතෘකාවක් පමණක් තෝරා වර්ණවත් චිත්‍රයක් අඳින්න.

---

## "අ" කොටස - චිත්‍ර සංරචනය

(1) දියඹෙන් ආ ඔරුවලින් මාළු මිලදී ගන්නා ගැනුම්කරුවන්

(2) වලක වැටුණු අලියකු බේරාගන්නා වනජීවී නිලධාරීන් හා ගම්මුන්

(3) වියළි කාලගුණයක් පැවැති ප්‍රදේශයක දිය සොයා යන මුවන්

(4) ගෙවතු වගාවක නියලෙන ගොවි - ගෙවිලියන්

## "ආ" කොටස - මෝස්තර නිර්මාණය

(5) අලංකාරය පිණිස බිත්තියක එල්ලා තැබීමට සුදුසු බිත්ති සැරසිල්ලක්

(6) බතික් සරොමකට සුදුසු සත්ව හැඩ යෙදූ සරොම් වාටියක්

(7) කුඩා ළමයකුගේ ඇඳුම් රෙද්දකට සුදුසු අඟල් 9 x 9 ප්‍රමාණයේ ව්‍යාප්ත මෝස්තරයක්

## "ඉ" කොටස - ග්‍රැෆික් චිත්‍ර

(8) නවතම වර්ගයේ සබන් කැටයකට සුදුසු දවටනයක්

(9) පාසලේ පැවැත්වෙන කලා උළෙලේ සඟරාවේ පිටකවරයට සුදුසු නිර්මාණයක්

(10) ළමා ගීතයකට සුදුසු සන්නිදර්ශන චිත්‍රයක්